## ඡන්දදායකයන්

# ලක්ෂ 4කට හැඳුනුම්පත් නැහැ

ගයාලි හිඟනආරච්චි

ජනාධිපතිවරණයේ ඡන්දය ප්‍රකාශ කිරීමට සුදුසුකම් ලබා සිටින මිලියන 15 ක ඡන්දදායකයන්ගෙන් ආසන්න වශයෙන් ලක්ෂ හතරක පමණ පිරිසකට වලංගු හැඳුනුම්පතක් නොමැති බව අනාවරණය වී ඇතැයි පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂක රෝහණ හෙට්ටිආරච්චි මහතා ඊයේ (18) පැවසීය.

පිටුව 2



## ලක්ෂ 4කට.......

මේ තත්ත්වය මත ඔවුන්ට ඡන්දය භාවිත කිරීමට ඇති ඉඩ ඇහිරීම වළක්වාලීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා සහ පුද්ගලයන් ලියා පදිංචි කිරීමේ කොමසාරිස්වරයා සමග එක්ව නිරීක්ෂණ සංවිධාන විසින් වැඩපිළිවෙළවල් ක්‍රියාවට නංවා ඇතැයිද ඒ මහතා කීය.ඒ අනුව හැඳුනුම්පත් නොමැති පුද්ගලයන්ට තාවකාලික හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා ජංගම සේවාවන් මේ දිනවල ක්‍රියාත්මක බවත්, මේ මාසය අවසාන වීමට පෙර අදාළ තාවකාලික හැඳුනුම්පත හෝ ලබා ගැනීමට කටයුතු කරන ලෙස මහජනතාවගෙන් ඉල්ලා සිටින බවත්, හෙට්ටිආරච්චි මහතා පැවැසීය. ඉදිරියේදී හෝ හැකියාවක් ඇත්නම්, අවුරුදු 10ට වලංගු තාවකාලික හැඳුනුම්පතක් නිකුත් කරන ලෙස මැතිවරණ කොමසාරිස්වරයාට යෝජනාවක් ඉදිරිපත් කර ඇතැයිද රෝහණ හෙට්ටිආරච්චි මහතා පදනම් ආයතනයේ ඊයේ (18) පැවැති ප්‍රවෘත්ති සාකච්ඡාවකදී පැවසීය.